ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
இலங்கை உழைக்கும் ஊடகவியலாளர் சங்கம்
Sri Lanka Working Journalists Association
Incorporated by Parliament Act No.46 in1987/Trade Union Registration No 8528
No.276/3, PRADEEPA MAWATHA, MALIGAWATTE, COLOMBO-10, SRI LANKA | TEL : 0112439276

14.05.2019
කොළඹ

මාධ්‍ය නිවේදනය

පැහැර ගැනීම් හා මිනීමැරුම් චෝදනා ලත් හමුද නිලධාරියා නැවතත් සක්‍රිය සේවයට

යුධ හමුදපති ලුතිනන් ජෙනරාල් මහේෂ් සේනානායක මහතා පසුගිය සෙනසුරාද පැවති රූපවාහිනි සාකච්ඡාවකට එක්වෙමින් පැවසූ පරිදි 2008 වසරේදී මාධ්‍යවේදී කීත් නොයාර් පැහැරගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන සැකකරු ලෙස චෝදනා ලබාසිටින සහ 2009 වසරේ සන්ඩේ ලීඩර් කතෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය සිදුකළ නීති විරෝධී හමුද කණ්ඩායමට නායකත්වය දුන් මේජර් ප්‍රභාත් බුලත්වත්ත නැවතත් සක්‍රිය සේවයේ පිහිටුවීම පිළිබඳව ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සිය බලවත් විරෝධය පළ කර සිටී.

මාධ්‍යවේදී කීත් නොයාර් පැහැර ගෙන ගොස් පහරදීම සම්බන්ධයෙන් 2017 වසරේදී අත්අඩංගුවට පත්ව ඇප මත සිටින මේජර් බුලත්වත්ත නැවතත් හමුද බුද්ධි අංශය තුළ සක්‍රිය සේවයේ පිහිටුවීම තුළින් මේ වන විටත් සිදු කෙරෙමින් පවතින මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන ඉලක්ක කර සිදුකරන ලද අපරාධ පිළිබඳ විමර්ශන කටයුතු සඳහා බලපෑම් සහ බාධා එල්ලවිය හැකි බව අපගේ විශ්වාසයයි. එමෙන්ම මෙම විමර්ශන සඳහා සාක්ෂි දුන් හා සහයෝගය දක්වූ නිලධාරීන් හා අනෙකුත් පුද්ගලයන්ගේ හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ගේ ජීවිතාරක්ෂාව පිළිබඳවද මෙවන් පත්කිරීම් හරහා සැක සංකා මතුවේ.

එබැවින් මෙම වරද නිවැරදි කිරීමට ජනාධිපතිවරයා සහ රජය ක්‍රියා කරනු ඇතැයි අප සංගමය බලාපොරොත්තු වෙමු.

| | |
|---|---|
| .............................. | .............................. |
| දුමින්ද සම්පත් | ෆ්‍රැන්ක් ද සොයිසා |
| සභාපති | ලේකම් |

President
Duminda Sampath
+94 773181731
dsampath15@gmail.com

General Secretary
Frank De Zoysa
+94 715493815
frankdezoysa@gmail.com

Treasurer
T. Nadarasa
+94 714967528
tnada21@gmail.com

National Organizer
Nimal Abeysinghe
+94 0779868010
nimalabesinghe589@gmail.com